


# ගඟ තවම ගලයි



*දිය බිඳු වෑහෙන හඬත්, තත් සරයෙන්.*
*එය පැතිරී යන බවත් සර පුවරුවෙන්.*
*තරංගාකාරව පැතිරී යන වයලින් පෙළක වැයුමක්.*
*ඒ මියැසි තරංගාකාර නාද මාලාවට ගැඹුරක්*
*මුහු කරනා චෙලෝ හඬත් පසුබිමින්.*
*ජලාශ්‍රිත පරිසරය වඩාත් උද්දීපනය කරන වස් වැයුමක්.*
*මේ සියල්ලට මද ලයෙන් රිද්මය මුහු කරන්නේ*
*තබ්ලාවට එක් වෙන පර්කෂන් හඬ.*

''ගඟ තවම ගලයි'' කෙටි ගී පදයකින් ගීයට මුල පුරන්නේ මධුර ගැඹුරු හඬක්. ගඟ ගැඹුවාට දෙපස ඉවුරු බලාගෙන සිටියි නිහඬවම. ගායනීය ප්‍රකාශනයට එක්වෙන ප්‍රේමවන්තයාට දැනෙන්නේ ඔහුගේ ප්‍රේමවන්තිය ගඟක් ලෙසින්. ඇයි ඒ? ඇය මේ ආදරණීය සිත් දෙඉවුරින් ඈතට ම ගලා යන නිසයි. ඒ ගීයේ ස්ථායි කොටස.

බටනලාව ආපසු අන්තර් වාදනයට. එයට එක්වෙන්නේ ඒකල වයලීන වාදනයක්. හැඟීම් බර ඒ ඒකල වාදනයට එක් වෙනවා වයලීන් පෙළක් ම, අන්තිමට.

කොහේදෝ සිට වට වර්ෂා ජලයෙන් ගඟේ දිය කැළඹෙයි. බාහිර බලපෑම්වලින් කැළඹුන ආදරයකි ඇයට ඇත්තේ. ගඟේ දිය කැළඹෙන විට එයින් පෙළුමට ලක්වෙන්නේ දෙපස ඉවුරුයි. ඒ පෙළීම ගෙන එන්නේ නුහුරු වේදනාවක්. හරියට පිට අයගේ බලපෑම්වලින් කැළැඹුණ ප්‍රේමවන්තිය නිසා ප්‍රේමවන්තයාගේ හිත පෙළනා නුහුරු වේදනාව වගෙයි. ඇයගේ ආදරයේ හැටි ඔහොම තමයි. එක තැනක එක විදියකට
නොරැඳෙන ආදරයක් ඇයට තියෙන්නේ.
ප්‍රේමවන්තයා ඇයගේ ආදරය ගැන විමසුමක.

පළවෙනි අන්තරා කොටසින් පස්සේ අන්තර් වාදනය පුරන්නේ ඒකල ලීඩ් ගිටාර් වාදනයක්. ගීයේ හැඟීම් බර බව වැඩි කරන මේ ඒකල වාදනය අග එක් වෙන කෙටි බට නළා හඬක් එක්ක ප්‍රේමවන්තයාගේ හඬ වඩාත් භාවමය ගායනයකට.

කඳු යායේ හරිත නිලෙන් අහසේ නිල වැහිලා ගිහින්. ඒ තරමට උසයි කඳු පෙළ. ගංගා දියේ තෙතමනයෙන් කඳු යායේ හරිත ගහ කොළ බරවෙලා. හරියට ප්‍රේමවන්තියගේ ආදරයේ තෙතමනයෙන් මේ ප්‍රේමවන්තයාගේ හිත බර වෙලා තියෙනවා වගෙයි. ඒත් කඳු පෙළක් වාගේ ප්‍රේමවන්තයාගේ ආදර හිත නිසලයි. කඳු පෙළ වගේ උස්වුණ ආදරයත් නොවෙනස්. කිසිදාක සැලෙන්නේ නෑ මොන වැසි වැස්සත්. ඒ හරියට ඔහු ඇයට පිදූ ආදරය වගේ. වඩාත් මන්ද්‍ර ස්වර සංගති ගායනයකින් ගීය වඩ ඩාත් භාවාත්මකයි.

නිතර අසන්නට නො ලැබෙන නමක් වුණත් මේ දාර්ශණික කවිතාව පළ කරන රංජිත් රූපසිංහ ගේය පද රචකයාණන්
වෙසෙසින් පැසසීමට ලක් වෙන්න ඕන.
පාරිසරික දේ උපමා, රූපක කොටගෙන ආදරය පිළිබඳව ලියැවෙන කවි ගී නම් බොහෝමයි. ඒ සුපුරුදු පාරිසරික උපමා රූපක ම පරිහරණය කරනා රංජිත් රූපසිංහයන්, ඒවා තමන්ගේ ගී පද රචනාවේ පෙළගන්වන්නේ වෙනම ම රීතියකට. ඉන් චිත්‍රණය වෙන පරිසරය අපට හුරු වුණත් කියැවෙන අදහස වඩාත් දාර්ශනික දැක්මකට රසිකයා යොමු කරවනවා.

මේ භාවමය පද පෙළ භාවමය තනුවකින් ස්වරග න්වා ඊට භාවමය මියැසි රටාවක් මුසු කරන්නේ නාලක අංජන කුමාර ප්‍රවීණ සංගීත වේදියායි. මනා සංයමයකින් මද ලයෙන්, නැත්නම් හෙමිහිට ගලා යන තාලයකින් ගී තනු ගැන්වීමේදී වචනාර්ථයට ම මුල් තැන ලබා දෙන්නට නාලක අංජන කුමාරයන් වග බලා ගන්නේ, අන්තරා දෙකොටස තනු දෙකට ගැයෙන්නට සිය නිර්මාණය නිමවන්නේය. ''මහ වැස්ස වැටී'' ලෙසින් ඇරඹෙන පළමු අන්තරා කොසත්, ''කඳු යාය නිලෙන්....'' පදයෙන් ඇරඹෙන දෙවන අන්තරා කොටසත් එකිනෙකට වෙනස් තනු දෙකක්. පදයෙන් පදය පදරුත් ඉස්මතු කරවන්නට පදයට එක් වුණ කෙටි වාද්‍ය ඛණ්ඩ ගීයේ භාවාත්මක බව වැඩි දියුණු කරවනවා.

මෙවන් අගනා පද රචනාවක් ලියැවෙන්නේත්, තනුවක් සහ සංගීතය නිර්මාණය වෙන්නේත් භාවමය ගායනාවකට උපතින් ම හිමිකම් ලත් මධුර හඬකටයි. ඒ හඬ ප්‍රවීණ ගායනවේදී සුනිල් එදිරිසිංහයන් සතුයි. කවදත් ජීවිතයේ යතාර්ථය පිළිබඳව ගායනීය කතිකාවතක යෙදෙන්නට උනන්දු වෙන සුනිල් එදිරිසිංහයන්ගෙන් මේ නිර්මාණයට ලැබෙනා දාකයත්වය අතිමහත්. හරවත් ගී පද සජීවී කරවන්නට නිතැතින්ම උනන්දු වෙන සුනිල් එදිරිසිංහයන්ගේ 'මල් වැහි පොද ' සංගත තැටියට එක් වුණ අගනා ගීයකි මේ.

**ගඟ තවම ගලයි**
**ගං දෑල නිසසලව බලා හිඳියි**
**ඔබ ගඟක් වගෙයි**
**සිත් දෑලවරින් ඈතට ම ඇදෙයි**

**මහ වැස්ස වැටී ගඟ දිය කැළඹේ**
**ගං ඉවුරු නුහුරු රිදුමකින් සැළෙයි**
**ගඟ ඔහොම තමයි**
**එක තැන නො රැඳෙයි**
**ඔය හදේ රැඳුණ ආදරය වගෙයි**

**කඳු යාය නිලෙන්, නිල් අහස වසයි**
**ගං දියෙන් වැදී සිත තවම බරයි**
**කඳු පෙළ නිසලයි**
**කිසිදා නො සැලෙයි**
**මා ඔබට පිදූ ආදරය වගෙයි.**

*ගායනය:* සුනිල් එදිරිසිංහ
*පද රචනය:* රංජිත් රූපසිංහ
*තනුව සහ සංගීතය:* නාලක අංජන කුමාර



සිසිර දිසානායක